# 2011 දේශපාලන ලෝකය දෙස ආපසු හැරී බලමු

ශ්‍රීලාල් සෙනෙවිරත්න




## ජනවාරි-ලෝකයට අලුත් රටක්

ගෙවුණු 2011 වසරේ ජනවාරි මාසය ලෝකයේ බොහෝ රටවල දේශපාලනයේ කේන්ද්‍රීය වෙනස්කම් සනිටුහන් කරනු ලැබූ මාසයක් විය. ලෝක බලවතා වන ඇමරිකාවේ ජනාධිපති බැරැක් ඔබාමාගේ පාලන බලය අර්බුධයකට ලක්කරමින් එරට පාර්ලිමේන්තුවේ බලය විරුද්ධ පක්ෂය වන රිපබ්ලිකන් පක්ෂයට හිමිවූයේ ජනවාරි මුල් සතියේදීය. දෙවන සතියේ ලෙබනන් ආණ්ඩුව බිඳවැටුණෝය.අගමැති සාද් අල් හරිරිගේ නායකත්වයෙන් යුතුව මාස 18ක් ක්‍රියාත්මක වූ ලෙබනන් ආණ්ඩුව බිඳ වැටුණේ අගමැතිවරයා විසින් සිය පියා ඝාතනය සම්බන්ධයෙන් ආණ්ඩුවේ සන්ධාන පාර්ශවයක් වන හිස්බුල්ලා සංවිධානයට චෝදනා කිරීම සහ එක්සත් ජාතීන්ගේ අන්තර් ජාතික අපරාධ අධිකරණය හමුවේ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීමට තීරණය කිරීමට විරෝධය දක්වමින් හිස්බුල්ලා සංවිධානයේ මන්ත්‍රීවරුන් ආණ්ඩුවෙන් ඉවත්වීම නිසාය.

'අරාබි වසන්තය' ලෙසින් පසුව හඳුන්වන්ට යෙදුණු අරාබි රටවල් කේන්ද්‍රකරගනිමින් හමායන්නට වූ දේශපාලන කුණාටුව ඇරඹෙන්නේ ද ජනවාරි මාසයේදීය. සිය පාලනයට එල්ල වූ ජනතා විරෝධය හමුවේ ටියුනීසියා ජනපති අබිදිනේ බෙන් අලි සිය ධූරයෙන් ඉල්ලා අස්වීම අරාබි වසන්තයේ මල් හටගැනීමේ ආරම්භය විය. ජනවාරි 14 දා බෙන් අලි සිය ධූරයෙන් ඉල්ලා අස්වූ අතර ඊළඟ සතියේ යේමන වැසියෝ දහස් ගණනක් පාරට බැස්සේ වසර 33ක් බලයේ සිටින ජනාධිපති අලි අබ්දුල්ලාට ඉල්ලා අස්වන ලෙස බලකරමිනි. අයර්ලන්ත සහාග රජයේ ඇතිවූ අවුල් හේතුවෙන් එරට පාර්ලිමේන්තුව විසිරුවා හැරීමට අගමැති බ්‍රයන් කෝවන්ට සිදුවූයේ ජනවාරි 25 දාය.

2011 ජනවාරි මාසය ලෝකයට තවත් අලුත් රටක් එකතු කළේය. ඒ ජනමත විචාරණයකින් සුඩානය දෙකට බෙදීම හේතුවෙනි. අප්‍රිකාවේ විශාලතම රාජ්‍ය වන සුඩානය රටවල් දෙකක් ලෙස බෙදී යා යුතු බවට රටේ දකුණු දිග වැසියන්ගෙන් 99%ක්ම තීරණය කර ඇති බව එරට ජනමත විචාරණ කොමිසම නිවේදනයක් නිකුත් කරමින් කියා සිටියේ ජනවාරි අවසන් සතියේදීය.

## පෙබරවාරි-වසන්ත කුණාටුව පෙරට

පෙබරවාරි මාසයේ ලෝකයේ වෙසෙස් අවධානයට ලක්වූ රටක් වූයේ පාකිස්තානයයි. රජයේ වියදම් කපාහැරීම පිණිස ඇමැති මණ්ඩලය කුඩා කිරීමට අගමැති මොහමඩ් රාසා ගිලානිට සහාය පළකරමින් එරට සියලුම ඇමැතිවරු පෙබරවාරි 09 දා සිය ධූරවලින් ඉල්ලා අස්වූහ. පසුදා වයඹ දිග පාකිස්ථානයේ මාඩන් නගරයේදී හමුදා පෙළපාලියකට එල්ල කෙරුණු මරාගෙන මැරෙන බෝම්බ ප්‍රහාරයකින් සෙබළුන් 27ක් ජීවිතක්ෂයට පත්ව තවත් 30ක් බරපතල තුවාල ලදහ. තලේබාන් ත්‍රස්තාවදීන්ගේ තෝතැන්නක් ලෙස සැළකෙන ප්‍රදේශයකදී එල්ල කෙරුණු මේ ප්‍රහාරය තලේබාන් සංවිධානයේ ක්‍රියාවක් බවට එරට ආරක්ෂක අංශ චෝදනා කළේය.

පෙබරවාරි 12 දින හිටපු අගමැතිනි බෙනාසීර් බූතෝ ඝාතනය සම්බන්ධයෙන් එරට හිටපු ජනාධිපති පර්වේස් මුසාරෆ් අත්අඩංගුවට ගන්නා ලෙස පාකිස්ථානයේ රාවුල් පිණ්ඩිහි අධිකරණයක් වරෙන්තු නිකුත් කළේය. 2007 වසරේ දෙසැම්බර් මස 27 බූතෝ ඝාතනය කෙරුණේ 'තෙහ්රික් ඊ තලේබාන්' සංවිධානය මගින් බවත්, එවක ජනාධිපතිව සිටි මුසාරෆ් විසින් ඒ සඳහා අවස්ථාව ලබාදී ඇති බව එරට අපරාධ පරීක්ෂණ වාර්තාවකින් අනාවරණය කර තිබීම වරෙන්තුවට හේතුවිය.

පෙබරවාරි මාසය පුරාම ඉරානය, ලිබියාව, මොරොක්කෝව, ඉන්දියාව, ඊජිප්තුව යන රටවල වරින් වර ආණ්ඩු විරෝධී උද්ඝෝෂණ වර්ධනය වූ අතර ඊජිප්තුවේ ජනතා නැගිටීම්වලට මුහුණ දී ගත නොහැකිව ජනාධිපති හොස්නි මුබාරක් රටේ පාලන බලය හමුදා මණ්ඩලයක් වෙත පවරා දෙමින් සිය ධූරයෙන් ඉල්ලා අස්විය.

පෙබරවාරි 26 දා, වසර 80ක් තිස්සේ අයර්ලන්තයේ රාජ්‍ය බලය හිමිකරගෙන සිටි ෆියානා ෆේල් පක්ෂය පරාජය කරමින් මහ මැතිවරණයෙන් විපක්ෂය ජය ලැබුවේය. ආණ්ඩුව ජාත්‍යන්තර ආධාර වශයෙන් ඩොලර් බිලියන 85ක ණයක් ලබගැනීමට එරෙහිව පැනනැගුණු ජනතා විරෝධය මේ පරාජයට මූලික හේතුව වූ බව දේශපාලන විචාරකයෝ පවසති.




## මාර්තු-ජපානය වැනසෙයි

දෙවන ලෝක යුද්ධයෙන් පසු ජපානය මුහුණ දුන් මහා ව්‍යසනය වාර්තා වූයේ මාර්තු 11 දිනය. ජපානයේ සෙන්ඩායි නුවරින් කිලෝ මීටර් 100 ක් තරම් ඈත මුහුදු පත්ලේ ඇතිවූ භූමිකම්පාවකින් පසු ඇතිවූ සුනාමියෙන් ජපානයේ ප්‍රධාන දූපත් හතරෙන් විශාලතම දූපත වන හොන්ෂු දූපතේ ෆුකුෂිමා ප්‍රාන්තයේ දහස් ගණනක් මියගොස් බිලියන ගණනක් වටිනා දේපොළ සුන්බුන් බවට පත්විය. ලෝකයේ විශාලතම න්‍යෂ්ඨික බලාගාර 15 අතරට වැටෙන ෆුකුෂිමා බලාගාරයේ ඇතිවූ පිපිරීම් සහ විකිරණ කාන්දුවීම මෙහිදී ජපානය මුහුණ දුන් බරපතලම ව්‍යසනය විය. ගිගා වොට් 7.5 ක විදුලියක් උත්පාදනය කෙරෙන එම බලාගාරය න්‍යෂ්ඨික ප්‍රතික්‍රියක හයකින් සමන්විත වන අතර ඉන් තුනක් සුනාමියට හසුව පුපුරා ගියේය.

ඊසාන දිග මියන්මාරයේ සිදුවූ ප්‍රභල භූමි කම්පාවකින් පුද්ගලයන් 75 දෙනෙකු ජීවිතක්ෂයට පත්වූයේ ද මාර්තු අවසන් සතියේදීය. අරාබි වසන්තයෙන් නැගී, සති දෙකකට ආසන්න කාලයක් සිරියාවේ පැවැති මහජන උද්ඝෝෂණ නිසා ජනපති බසාර් අල් අසාඩ්ගේ ආණ්ඩුව මාර්තු 29 දා ඉල්ලා අස්විය. එහෙත් ලිබියාවේ උද්ඝෝෂකයන්ට එරෙහිව ජනාධිපති මුහම්මර් ගඩාෆි සිය හමුදා යොදා බිහිසුණු ප්‍රහාර එල්ල කරන්නට පටන් ගැනීම හේතුවෙන් රට බෙහෙවින් අනාරක්ෂිත තත්ත්වයකට පත්වීම මාර්තු මාසයේ දකින්නට ලැබුණ තත්ත්වයකි. එහි ප්‍රතිපලය ලෙස ජාත්‍යන්තරය ලිබියාවේ ප්‍රශ්ණයට අතගැසුවේය. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය ලිබියාවට ඉහළ අහස ගුවන් තහනම් කලාපයක් ලෙස නම් කිරීම සඳහා ඉදිරිපත් කළ යෝජනාව සාමාජික රටවල් 5 ක වැඩි ඡන්දයෙන් සම්මත විය. ඒ සමගම ඇමරිකාව, බ්‍රිතාන්‍ය සහ ප්‍රංශය ලිබියාවේ ගුවන් හමුදා කඳවුරු වෙත ගුවන් ප්‍රහාර ආරම්භ කළේය.

## අප්‍රේල්-සායි බාබා සමුගනී

අප්‍රේල් ආරම්භ වන්නේ ක්‍රිකට් ක්‍රීඩාව වෙත ලෝක අවධානය යොමු කරවමිනි. ඉන්දියාවේ මුම්බායිහිදී පැවැත්වුණු ක්‍රිකට් ලෝක කුසලාන 2011 අවසන් තරගයට තේරී සිටියේ අසල්වැසි රටවල් දෙක වන ශ්‍රී ලංකාව සහ ඉන්දියාවයි. ශ්‍රී ලංකා පිළ පරදවා තියුණු ජයක් ලබාගනිමින් ඉන්දියාව ලෝක ශූරතාවය හිමිකරගත්තේ අප්‍රේල් 02 දාය. ජනාධිපතිවරණයෙන් පරාජයට පත්වුවද සිය තනතුරෙන් ඉල්ලා අස්නොවී ජනාධිපති මන්දිරයේ බංකරයක් තුළ සැගව සිටියදී ප්‍රංශ හමුදා කණ්ඩායමක් විසින් අයිවරිකෝස්ට් ජනාධිපති ලෝරන්ට් බැග්බෝ අත්අඩංගුවට ගැනීම අප්‍රේල් 11 දා ලෝක දේශපාලන කරලියෙන් වාර්තා වූ හාස්‍ය ජනක සිදුවීමකි. මියන්මාර් හමුදා රජයේ නායක ත්වාන් ස්වේ එරට පාලනය සිවිල් ආණ්ඩුවකට පවරාදෙමින් සිය ධූරයෙන් ඉවත්වීම මෙන්ම කියුබාවේ අසහාය නායක පිදෙල් ක්‍රස්තෝ කොමියුනිස්ට් පක්ෂයේ නායකත්වයෙන් ඉල්ලා අස්වීමද වාර්තා වූයේ අප්‍රේල් මාසයේදීය.

ලොව පුරා දහස් සංඛ්‍යාත බැතිමතුන් පිරිසකගේ අධ්‍යාත්මක නායකයකු වූ සත්‍ය ශ්‍රී සායි බාබා අභාවප්‍රාප්තවීම සහ එංගලන්තයේ රාජකීය පවුලේ විවාහය අප්‍රේල් අවසානයේ සිදුවිය. 24 දා ඉන්දියාවේ ආන්ද්‍ර ප්‍රාන්තයේ පුත්තපාර්ති හි රෝහලකදී සායිබාබා මියගියේය. එංගලන්තයේ ඔටුන්න හිමි චාල්ස් කුමරුගේ පුත් විලියම් - කේට් විවාහ දිවියට එළඹුණේ 29 දාය.

## මැයි-ඔසාමා ඝාතනය

ඇමරිකාව සිදුකළ රහස් හමුදා මෙහෙයුමකින් අල්-ක්වයිදා නායක ඔසාමා බින් ලාඩන් ඝාතනය කිරීම වාර්තා වූයේ මැයි 01 දාය. ලාඩන් ඝාතනය කෙරුණෙ පකිස්ථානයේ ඇබොටාබාද්හිදීය. අති නවීණ තාක්ෂණික උපක්‍රම සහ අවි යොදාගනිමින් විනාඩි හතලිහක් තුළ සීල් ප්‍රහාරකයන් සිදුකළ මෙහෙයුම අවසානයේ ඔසාමා මරා දැමුණු අතර ඔහුගේ සිරුර ගෙන ගොස් මුහුදට විසිකර දැමීමට සීල් භටයන් ක්‍රියා කළේය. ඔසාමා ඝාතනයත් සමඟ ත්‍රස්තවාදය අවසන් බව ඇමරිකාවේ විශ්වාසය විය.

එහෙත් ඔසාමා ඝාතනයෙන් දෙවන දිනයේ ඇමරිකාව පාකිස්ථානයේ තිබූ සිය තානාපති සහ කන්සියුලර් කාර්යාල තුනක් වසාදමා ඒවායේ සිටි කාර්ය මණ්ඩලය සිය රට කැඳවාගත්තේය. සීල් බලකායේ භටයන්ට සහ ඔවුන්ගේ පවුල්වලට විශේෂ ආරක්ෂාවක් ලබාදුන්නේය. ඉන් දෙදිනකට පසු මැයි 05දා ඇමරිකාවේ පාසල් 29ක් හදිසියේ වසා ඒවායේ සිසුන්ගේ ජීවිතාරක්ෂාව සඳහා විශේෂ මෙහෙයුමක් ක්‍රියාත්මක කළේ 'ඇන්ත්‍රැක්ස් ජෛව රසායනික' ප්‍රහාරයකින් ආරක්ෂාව සඳහාය.

## ජුනි-සිරියා වසන්තය

සිරියා ජනාධිපති බසාර් අසාද්ට ධූරයෙන් ඉවත්වන ලෙස බල කරමින් වීදි බැස කැරලිගසමින් සිටින ජනතාව සහ හමුදාව අතර ගැටුම් දරුණු අතට හැරී දෙපාර්ශ්වයේම මරණ සංඛ්‍යාව ඉහළ යාම ජුනි ආරම්භයේ දී වාර්තා වූයේ අරාබි වසන්තයේ ප්‍රතිපළයක් ලෙසිනි. ජුනි 06 දින උතුරු සිරියාවේ තුර්කි දේශ සීමාවට ආසන්නයේ ආරක්ෂක අංශ සහ කැරලිකරුවන් අතර ඇතිවූ සටනකදී ආරක්ෂක අංශ සාමාජිකයන් 122ක් මරා දැමීමට කැරලිකරුවන් සමත්වූහ. මාර්තු මාසයේ උද්ඝෝෂණ ආරම්භයේ සිට ජුනි මාසය දක්වා කාලයේදී හමුදා ප්‍රහාරවලින් 1200ක් පමණ ජීවිතක්ෂයට පත්ව තිබිණ.

ඔසාමා බින් ලාඩන් ඝාතනයෙන් පසුව හිස්වූ අල්-ක්වයිදා සංවිධානයේ නායක තනතුරට එහි ජ්‍යෙෂ්ඨ අණ දෙන නිලධාරියෙකු මෙන්ම දෙවැනි නායකයා වූ අයිමාන් අල් සවාරි පත්වන්නේ ජුනි 16 දාය.

මහජන විරෝධතා හේතුවෙන් ජනවාරි මාසයේදී ධූරය අතහැර සෞදි අරාබිය වෙත පලා ගිය ටියුනීසියාවේ හිටපු ජනපති සීනේ එල් බෙන් අලි සහ ඔහුගේ බිරිය ලෙයිලාට ටියුනීසියා අධිකරණයක් මගින් වසර 35ක සිරදඬුවමක් නියම කළේ ජුනි 20දාය. ඔවුන්ට විරුද්ධව මහජන මුදල් වංචා කිරීම සම්බන්ධයෙන් පවරා තිබූ නඩුව විභාග කෙරුණේ ඒක පාර්ශිකවය. මහජන විරෝධතා හමුවේ බලයෙන් ඉවත් නොවී විරෝධතාකරුවන්ට ප්‍රහාර එල්ල කරමින් සිටින ලිබියා නායක මුවම්හර් ගඩාෆි අත්අඩංගුවට ගැනීමට ජාත්‍යන්තර යුද අපරාධ අධිකරණය වරෙන්තු නිකුත් කළේ ජුනි 27 දාය. මහජනතාවගෙන් ගව් ගණනක් දුරස් සුපිරි ජනපතිවරුන් පිරි ලෝකයේ මහජනතාව අතරට ගිය ජනාධිපතිවරයකුට පුරවැසියෙකුගෙන් කණේ පාරක් එල්ලවීම ජුනි අවසානයේ වාර්තා වූ අපූර්ව සිදුවීමකි. ජන රැලියක් අවසානයේ සිය ආධාරකරුවන් අතරට ගොස් මේ අකරතැබ්බයට මුහුණ පෑවේ ප්‍රංශ ජනාධිපති නිකලස් සාකෝසිය.

## ජුලි-තායි ප්‍රථම අගමැතිනිය

අප්‍රිකා මහද්වීපයේ විශාලම රට වූ සුඩානය දෙකඩ වී 'දකුණු සුඩාන ජනරජය' නමින් නව රාජ්‍යයක් නිල වශයෙන් ප්‍රකාශයට පත්කෙරුණේ ජූලි මාසයේදීය. ජූලි 09 දින නව රාජ්‍ය ප්‍රකාශයට පත්කිරීමෙන් පසු ජූලි 14 වෙනිදා එක්සත් ජාතින්ගේ සංවිධානය විසින් එය ලෝකයේ 193 වන රාජ්‍ය ලෙස පිළිගත්තේය. ලිබියා ජනාධිපති මුහම්මර් ගඩාපිට ඉල්ලා අස්වන ලෙස බලකරමින් රජයේ හමුදා සමග සටන් වැද සිටින කැරලිකාර පාර්ශ්වය මගින් පිහිටුවාගත් විකල්ප රජය (ජාතික අන්තර්වාර මණ්ඩලය) බ්‍රිතාන්‍ය විසින් ලිබියාවේ නිත්‍යානුකූල රජය ලෙස පළිගත්තේද ජූලි මාසයේදීය.

තායිලන්ත මහා මැතිවරණය ජයගත් විපක්ෂය එරට ප්‍රථම අගමැතිනිය ලෙස ජිංග්ලන් සිනමාත්‍රා අභිෂේක කළේ ජූලි මුලදීය. හිටපු අගමැතිවරයෙකු වූ තක්සින් සිනමාත්‍රාගේ නැගණිය වූ ජිංග්ලන්ගේ නායකත්වයෙන් යුත් විපක්ෂය පාර්ලිමේන්තු ආසන 500 න් 265 ක් දිනා ගත් අතර, පාලක පක්ෂයට හිමි වූයේ ආසන 159 ක් පමණි.

ළබන කළාපයට